**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - දකුණු පළාත**
**கூட்டுறவு அபிவிருத்தி திணைக்களம் - தென் மாகாணம்**
**DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT - SOUTHERN PROVINCE**
**147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල. 147/3, பெட்டிகலவத்தை, காலி. 147/3, Pettigalawatta, Galle.**

| | | | | | |
|---|---|---|---|---|---|
| කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 091-2235950 | කාර්යාලය / ෆැක්ස්<br>அலுவலகம் / பேக்ஸ்<br>Office / Fax | 091-2234380 | විද්‍යුත් තැපෑල<br>ஈ-மேல்<br>E-mail | coopdepartmentsp@gmail.com |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | දපස /සමු.සං./සං/22/ආපදා | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2020.04. 22 |

සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,
ප්‍රධාන කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට.

<u>**COVID-19 වෛරසය හේතු කොට ගෙන, උද්ගතව ඇති තත්වය මත සමුපකාර සමිතිවල නීතිමය කාර්යන් ඉටු කිරීමේ දී සැලකිය යුතු කරුණු**</u>

උක්ත ශීර්ෂගත මාගේ 2020.04.04 දිනැති උපදෙස් පත්‍රිකාව, එහි 02 හා 03 වගන්ති ඉවත් කර අනෙකුත් කරුණු නැවත අංකනය කර සංශෝධනය කරනු ලබන අතර එහි පිටපතක් අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මේ සමග එවමි.

02. එකී උපදෙස් පත්‍රිකාවේ සඳහන් සමුපකාර සමිති වලට අදාල කරුණු සම්බන්ධයෙන් සමිති භාර නිලධාරීන් මගින් එම සමුපකාර සමිති දැනුවත් කරන ලෙසත්, එහි සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙසත්. මේ සම්බන්ධයෙන් තම දිස්ත්‍රික්කයට අනුයුක්ත සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ආර්.ජී.කන්නන්ගර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

ආර්.ජී.කන්නන්ගර
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්-

02. ලේකම්,කෘෂිකර්ම...සමුපකාර අමාත්‍යාංශය - කා.දැ.පි
04. සියළුම සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් - දැ.පි හා අ.ක.ස

# සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - දකුණු පළාත
## கூட்டுறவு அபிவிருத்தி திணைக்களம் - தென் மாகாணம்
## DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT - SOUTHERN PROVINCE

**147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල. 147/3, பெட்டிகலவத்தை, காலி. 147/3, Pettigalawatta, Galle.**

| | | | | | |
|---|---|---|---|---|---|
| කොමසාරිස් / ஆணையாளர் / **Commissioner** | 091-2235950 | කාර්යාලය / ෆැක්ස් / அலுவலகம் / பேக்ஸ் / **Office / Fax** | 091-2234380 | විද්‍යුත් තැපෑල / ஈ-மேல் / **E-mail** | coopdepartmentsp@gmail.com |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / **My No.** | දපස /සමු.සං./සං/22/ආපදා | ඔබේ අංකය / உமது இல. / **Your No.** | | දිනය / திகதி / **Date** | 2020.04. 22 |

සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්,

ප්‍රධාන කාර්යාලය/ගාල්ල/මාතර/හම්බන්තොට.

**<u>COVID-19 වෛරසය හේතු කොට ගෙන, උද්ගතව ඇති තත්වය මත සමූපකාර සමිතිවල නීතිමය කාර්යන් ඉටු කිරීමේ දී සැලකිය යුතු කරුණු</u>**

උක්ත කරුණ හේතු කොට ගෙන මේ වන විට රට තුල අර්බුදකාරී තත්වයක් නිර්මාණය වී ඇති බැවින් හා පවතින ඇඳිරි නීති තත්වය මත සාමාන්‍ය පරිදි කටයුතු රාජකාරී කටයුතු සිදු නොවන බැවින් සමූපකාර සමිතිවල නීතිමය කාර්යන් ඉටු කිරීමේ දී පහත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර කටයුතු කරන ලෙසත් මේ සම්බන්ධව සමූපකාර සමිති දැනුවත් කරන ලෙසත් මෙයින් දන්වමි.

01. යම් පුද්ගලයෙකුගෙන් හෝ සමිතියකින් ණයක් හෝ යම් මුදලක් අය විය යුතු වන අවස්ථාවක එකී ණය හෝ මුදල් 2020.03.15 දිනට පසු දිනයක් ගෙවන ලෙස දන්වා එකී පාර්ශවයන්ට එන්තරවාසි යොමු කර ඇති අවස්ථාවක, එම එන්තරවාසි අවලංගු කර, මෙම අර්බුදය අවසන් වී රට යථා තත්වයට පත්වී සාමාන්‍ය පරිදි කටයුතු සිදු වීම ආරම්භ වීමෙන් පසු නැවත ලියාපදිංචි තැපෑලෙන් එන්තරවාසි යොමු කිරීමට සමිති දැනුවත් කිරීම. එහිදී මුල් එන්තරවාසි අවලංගු කරන බවත් ඊට හේතුව දන්වන ලෙසත් නැවත නියමිත කාලය ලබා දෙමින් ලියාපදිංචි තැපෑලෙන් එන්තරවාසි යොමු කරන ලෙසත් සමිති දැනුවත් කිරීම.

02. සමූපකාර පනතේ 60.(2) වගන්තිය යටතේ තීරණයක් දීමට මත්තෙන් හේතු ඉදිරිපත් කිරීම සඳහා යම් පුද්ගලයෙකුට අවස්ථාව ලබාදී ඇති කාල සීමාව 2020.03.15 දිනෙන් පසු දිනයක අවසන් වන අවස්ථාවක නැවත හේතු ඉදිරිපත් කිරීම සඳහා නැවත එම පුද්ගලයාට ඉහත පරිදි සාධාරණ අවස්ථාවක් ලබා දීම.

03. සමූපකාර පනතේ 46.(1) වගන්තිය යටතේ සිදු කරනු ලැබූ පරීක්ෂණයකින් පසු එම පනතේම 48 හා 60අ.(2) වගන්ති යටතේ ක්‍රියා කිරීමට ඇති අවස්ථාවක එසේ කිරීමට විරුද්ධව හේතු ඉදිරිපත් කිරීම සඳහා යම් පුද්ගලයෙකුට/ කාරක සභාවකට අවස්ථාව ලබාදී ඇති කාල සීමාව 2020.03.15 දිනෙන් පසු දිනයක අවසන් වන අවස්ථාවක නැවත හේතු ඉදිරිපත් කිරීම සඳහා ඉහත පරිදි එම පුද්ගලයාට සාධාරණ අවස්ථාවක් ලබා දීම.

04. සමූපකාර පනතේ 66 වගන්තිය යටතේ නියෝගයක් දීමට මත්තෙන් කරුණු කියා සිටීමට හා හේතු ඉදිරිපත් කිරීම සඳහා යම් පුද්ගලයෙකුට අවස්ථාව ලබාදී ඇති කාල සීමාව 2020.03.15 දිනෙන් පසු දිනයක අවසන් වන අවස්ථාවක නැවත හේතු ඉදිරිපත් කිරීම සඳහා ඉහත පරිදි එම පුද්ගලයාට සාධාරණ අවස්ථාවක් ලබා දීම.

05. සමුපකාර පනතේ 43අ.(2) වගන්තිය යටතේ යම් සමිතියක් විසින් තම සමිතියට අදාලව ගිණුම් හා සංඛ්‍යාන පිළිබඳ වාර්ෂික ප්‍රකාශණයක් ඉදිරිපත් කල යුතු කාල සීමාව මෙකී අර්බුදකාරී කාල සීමාවට ඇතුළත් වේ නම් එනම් එම කාල සීමාව 2020.03.15 දිනෙන් පසු දිනයන් දක්වා දික් වේ නම් ඉහත පරිදි ඒ සඳහා එම සමිතියට සාධාරණ කාලයක් ලබා දීම.

06. ඉහත කරුණු පිළිබඳව ඔබ දිස්ත්‍රික්කයට අයත් සමිති භාර සමුපකාර සංවර්ධන නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඔවුන් මගින් සමුපකාර සමිති වලට අදාල කරුණු සම්බන්ධයෙන් සමිති දැනුවත් කරන ලෙසත් දන්වමි. තවද මේ සම්බන්ධව යම් ගැටළුවක් වේ නම් ප්‍රධාන කාර්යාලයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් බී. ජේ පෙරේරා මහතාගෙන් හෝ ප්‍රධාන කාර්යාලයේ සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි කේ. එච් පියසේන මහතාගෙන් වැඩිදුර උපදෙස් ලබා ගන්නා ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්.ජී.කන්නන්ගර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

ආර්.ජී.කන්නන්...
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්-

02. ලේකම්,කෘෂිකර්ම...සමුපකාර අමාත්‍යාංශය - කා.දැ.පි
04. සියළුම සමුපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් - දැ.පි හා අ.කා.ස